**සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2017**

**-----------------------------------------**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 නොවැම්බර් 15 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) ප්‍රමිතයේ 32 වගන්තිය ප්‍රකාරව, ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවද මණ්ඩලය විසින් යතුරු පැදි විකිණීමේ අලාභය වූ රු.189,638 ක් වෙනත් ආදායම්වලින් හිලව් කර දක්වා තිබුණි. තවද, එකතුව රු.844,650,423 ක් වූ බැංකු ගිණුම් අටක හර ශේෂ, එකතුව රු.105,184,705 ක් වූ බැංකු ගිණුම් තුනක බැර ශේෂ සමඟ හිලව් කර රු.739,482,123 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි. කෙසේ වුවද මෙම ශේෂයන් ගිණුම් සටහන් තුළ වෙන් වශයෙන් පෙන්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 54 ඡේදය ප්‍රකාරව අස්පෘෂ්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම පෙන්විය යුතු වුවද, මණ්ඩලය විසින් එකතුව රු.2,243,478 ක් වූ පරිගණක මෘදුකාංග (Computer Software) හා වෙබ් අඩවි සංවර්ධනය (Website Development) යනාදිය දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(iii) ප්‍රමිතයේ 66 ඡේදය ප්‍රකාරව, වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන වත්කම්, ජංගම වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද, රු.1,012,526,906 ක් වටිනා වසරක් තුළ කල්පිරෙන ස්ථාවර තැන්පතු 11 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ නිරූපණය කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලැබී තිබූ මණ්ඩලයේ පොළී ආදායම රු.119,182,529 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.120,768,549 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.1,586,020 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.165,556,090 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 34 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, මණ්ඩලයේ ඉඩම් හා ගොඩනැගිලි 2010 දෙසැම්බර් 31 දිනෙන් පසුවද, යන්ත්‍ර සූත්‍ර 2012 දෙසැම්බර් 31 දිනයෙන් පසුවද ප්‍රත්‍යාගණනය කර සධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 55 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මණ්ඩලය විසින් වත්කමක ක්ෂය කිරීම එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙන ආපසු ආරම්භ කර තිබූ නමුත්, වත්කම් මිලදීගත් වර්ෂයේ සමානුපාතිකව ක්ෂය කිරීමත්, විකුණන වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදනය නොකිරීමත් මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තිය වන බව මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

ප්‍රමිතයේ 63 ඡේදය ප්‍රකාරව, සේවක පාරිතෝෂික සඳහා වූ වගකීම හා වත්කම් වෙන වෙනම හඳුනාගෙන ඒවා එකිනෙකට හිළව් කිරීමෙන් ඇතිවන වර්තමාන ශුද්ධ පාරිතෝෂික අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නොදක්වා පාරිතෝෂික වත්කම් හා ඊට අදාළ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන වෙනම දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල දක්වා තිබුණු ස්ථාවර තැන්පතු වටිනාකම වූ රු.1,050,939,528 ක් තුල පාරිතෝෂික ආයෝජන අගයේ වටිනාකම වූ රු.38,412,622 ක් දැක්වීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම හා පාරිතෝෂික ආයෝජන වටිනාකම පිළිවෙලින් එම වටිනාකමින් වැඩියෙන් හා අඩුවෙන් නිරූපණය වී තිබුණි.

(ආ) 2017 මාර්තු හා අප්‍රේල් මාසවල සිට භාවිතයට ගෙන තිබූ පිළිගැනීමේ කවුන්ටරයේ හා තොරතුරු තාක්ෂණ අංශයේ ඉදිකිරීම්වලට අදාළව 2017 වර්ෂය සඳහා පිළිවෙලින් රු.230,999 ක් හා රු.209,171 ක් වූ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 01 දින රු.72,600 කට මිලදී ගන්නා ලද වායු සමීකරණ යන්ත්‍රයේ 2017 වර්ෂය සඳහා ක්ෂය ලෙස රු.13,612 ක් පමණක් ගැලපීම් කල යුතු වුවද, රු.54,698 ක් ක්ෂය කර තිබීම හේතුවෙන් ක්ෂය වියදම රු.41,086 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, කාර්ය මණ්ඩලය සඳහා වූ සියලුම දීමනාවල එකතුව සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දීමනා වටිනාකම් අතර රු.3,709,070 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම ලොතරැයි දිනුම් ඇදීම සඳහා කාර්ය මණ්ඩලයට සිදුකර ඇති ගෙවීම්වලට අදාළව මූල්‍ය අංශය හා පරිපාලන අංශය ඉදිරිපත් කල තොරතුරු අතර රු.2,828,300 ක වෙනසක්ද නිරීක්ෂණය වූ අතර මෙම වෙනස්කම් සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.

## 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.13,249,192 ක් වූ වියදම් ගිණුම් ශේෂ 04 ක් සම්බන්ධයෙන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයය | වටිනාකම<br>රු. | | ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි |
|---|---|---|---|---|
| (i) | වාහන කුලී වියදම් | 9,317,866 | - | ධාවනය පිළිබඳ මාසික වාර්තා (Monthly Record) |
| | | | - | වාහන කුලියට ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ විශේෂ අනුමැතිය |
| (ii) | සේවක මණ්ඩල පුහුණු වියදම් | 1,740,549 | - | 2017 වර්ෂයේ පුහුණු සැලැස්ම |
| | | | - | රු.100,000 ක සම්පත් දායක දීමනාවට අදාළ ගෙවීම් තීරණය කිරීමේ පදනම |
| | | | - | පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූවන්ගේ පැමිණීමේ ලේඛන |
| | | | - | Multi Media Diploma පුහුණු පාඨමාලාව සඳහා කැඳවීමේ ලිපිය |
| | | | - | චක්‍රලේඛ/ අභ්‍යන්තර මැමය |
| | | | - | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හා පත්‍රිකාව |
| | | | - | මණ්ඩලය හා පුහුණුකරු සමග ඇති කරගත් ගිවිසුම |
| (iii) | ජංගම රථවල රියදුරන්ට අතිකාල ගෙවීම. | 1,047,590 | - | ජංගම ලොතරැයි අලෙවියේ නිරත රියදුරන්ගේ අතිකාල දීමනාවලට අදාළ පැමිණීම පිටවීම සනාථ කරගත් ලේඛන |
| (iv) | අලෙවි ප්‍රවර්ධන/ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදී තිබූ යතුරු පැදි වලට අදාළ ඉන්ධන වියදම්, වාරසේවා හා අළුත්වැඩියා හා නඩත්තු වියදම් | 1,143,187 | - | යතුරු පැදිවල අදාළ ධාවන සටහන් හා ලොග් සටහන්, හෝ ධාවනය කල ස්ථාන හා රාජකාරී තහවුරු කෙරෙන ලියවිලි |
| | | **13,249,192** | | |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ විධිමත් ලෙස සම්පූර්ණ වූ පසුව ඉතා කඩිනමින් විගණනය වෙත ලබාදෙන ලෙස 2016 වර්ෂයේ සිට විගණන විමසුම් හා තොරතුරු ඉල්ලීම් ලිපි ගණනාවකින් ඉල්ලා තිබුණි. එසේම එම කාලපරිච්ඡේදය තුල පැවති විගණන කමිටු රැස්වීම්වලදී ද ඒ පිළිබඳව අවධානය යොමු කරන ලදී. එහෙත් ගනුදෙනු ක්‍රියාත්මක කර අවසන් වූ පසුව හා මාස 02 ත් මාස 04 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව එම වාර්තා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. මේ නිසා මෙම වාර්තාවේ පෙන්වාදී ඇති ඇතැම් අලාභ හා අවදානම් අවම කර ගැනීමට මණ්ඩලයට තිබූ අවස්ථා අහිමි වී ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල කුලී පදනම මත මණ්ඩලය වෙත ලබා ගැනීම සඳහා එළඹ තිබූ ගිවිසුම, ඒක පාර්ශවිකව මණ්ඩලය විසින් කඩ කිරීම නිසා මණ්ඩලයට අයවිය යුතු රු.5,700,000 ක මුදල වසර 14 ක් තිස්සේ අයකරගත නොහැකි වී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී ගෙවීමේ පදනම මත නිලධාරීන්ට ලබාදී තිබූ මෝටර් සයිකල් සඳහා වසර 06 ක් ගතවී තිබුණද ඒ සඳහා අයවිය යුතු රු.192,817 ක මුදල් සහ වසර 1 ත් 5 ත් අතර කාලයක් තිස්සේ අලෙවිකුටි ඉදිකිරීම වෙනුවෙන් ලබාදී තිබූ රු.856,498 ක් වශයෙන් එකතුව රු.1,049,315 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| **(අ)** | 1997 **අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත** | |
| | 11 (අ) වගන්තිය හා 18 (2) වගන්තිය | ජනාධිපති අරමුදලට අරමුදල් උත්පාදනය කිරීම මණ්ඩලයේ ප්‍රධානම කාර්යය වුවද, 2018 මාර්තු 03 දින වන විට එම අරමුදලට ප්‍රේෂණය කල යුතු හිඟ මුදල වූ රු.17,862,341 ක් නියමිත පරිදි ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරණ ආදායම් බදු පනතේ 133 වන වගන්තියට අදාළ ඇමුණුමක් ලෙස නිකුත් කර තිබූ, 2011 පෙබරවාරි 28 දිනැති අංක **SEC 2011/1** දරන චක්‍රලේඛයේ 03 වන ඡේදය | පොලී ආදායම මත අයකරනු ලබන රඳවාගැනීමේ බදු ප්‍රතිශතය සියයට 10 ක් වුවද, එය නොසලකා එක් රාජ්‍ය බැංකුවකින් සියයට 10 ක් ලෙසද, තවත් රාජ්‍ය බැංකු 2 කින් එය සියයට 8 ක් ලෙසද රඳවාගැනීමේ බදු අයකර තිබුණි. එකම ආයතනයක් වෙනුවෙන් රඳවාගැනීමේ බදු ප්‍රතිශත දෙකක් අය කිරීම සම්බන්ධව අදාල බැංකුවලින් විමසීමක් සිදුකර නිවැරදි ප්‍රමාණය ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

**(ඇ) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 03 වැනි වගන්තිය ප්‍රකාර රජයේ ගැසට් නිවේදනය**

-----------------------------------

සියයට 15 හෝ රු.5 යන අගයන් දෙකෙන් වැඩි අගයෙන් සෑම ලොතරැයියකටම මිල වැඩි කිරීමට බලතල ලැබී තිබියදී, ලොතරැයි පතක මිල සියයට 50 ක් නැතහොත් රු.10 කින් වැඩි කිරීම නිසා මණ්ඩලයට රු.මිලියන 11.2 ක අසාමාන්‍ය නිෂ්කාර්ය මුද්‍රණ වියදමක් දැරීමට සිදුවී තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

-----------------------------------

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වන ඡේදය හා 2007 ජුනි 12 දිනැති අංක 15/2007 (i) හා 2014 දෙසැම්බර් 26 දිනැති අංක 15/2007 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමත ණය සීමාව ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකු වෙත රු.241,040 ක් ද නිලධාරීන් 05 දෙනෙකු වෙත රු.2,401,080 ක් ද ලෙස එකතුව රු.2,642,120 ගෙවා තිබුණු අතර නිලධාරීන් තිදෙනෙකුට දෙවරක් දේපල ණය ලබාදී තිබුණි. තවද, ණයකරුවන් 05 දෙනෙකු විසින් දැරිය යුතු රු.42,094 ක නීතිඥ ගාස්තුව මණ්ඩලය විසින් දරා තිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

-----------------------------------

(i) මුදල් රෙගුලාසි 103 හා 103 (1) ඊ

වාහන අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපති වෙත හා පොලීසිය වෙත වාර්තා කිරීම මෙන්ම වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන යම් අලාභයක් වෙතොත් අයකර ගැනීමට හැකි ලේඛනයක් පවත්වාගෙන යෑම කල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වාහන 42 කට අදාළව අනතුරු 61 ක් සිදුවී තිබුණු අතර මණ්ඩලයට සිදුවූ පාඩුව රු.2,010,948 ක් වී තිබුණි. රක්ෂණ ආයතනයකින් ආවරණය කර ගත නොහැකි එම අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර නොගෙන මණ්ඩලයේ අරමුදලින් දරා තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 135

එකතුව රු.1,549,705 ක් වූ වවුචර් පත් 4 ක් සඳහා ගෙවීම් නිර්දේශ කිරීම, බලය දීම, අනුමත කිරීම හා ගෙවීම් සහතික කිරීම සිදු කිරීමේදී ලියකියවිලිවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 260 හා 389

විධිවිධාන ප්‍රකාරව ගෙවීම්වලට අදාළ චෙක්පත් නියමිත පුද්ගලයාට හෝ ආයතනයට භාරදිය යුතු වුවත් එකතුව රු.1,417,500 ක් වටිනා චෙක්පත් 03 ක් ද, පුහුණු වැඩසටහන් වෙනුවෙන් දරන ලද රු.31,075 ක් වෙනුවෙන් විවෘත චෙක්පතක් ද ලෙස එකතුව රු.1,448,575 ක් වූ චෙක්පත් 04 ක් මණ්ඩලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය විසින් ලබාගෙන තිබුණි.

| | | |
|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 757 (2) | විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී *භාණ්ඩ* සමීක්ෂණයක් සිදුකර තිබූ නමුත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 1179 | විධිවිධාන ප්‍රකාරව නිලධාරයකුට ගෙවිය හැකි ගාස්තු ඔහුගේ මාසික වැටුපට වැඩි නොවිය යුතු වුවත්, මණ්ඩලයේ නිලධාරින්ගේ මාසික වැටුප ඉක්මවා ගාස්තු හා ලොතරැයි දිනුම් වාර දීමනා ගෙවා තිබූ අවස්ථා විය. සමාලෝචිත වර්ෂය තුල එසේ මාසික වැටුප් ඉක්මවා ගෙවා තිබූ දීමනා රු.23,567,305 ක් විය. |

**(ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| (i) | 2015 මැයි 25 දිනැති අංක පීඊඞී/1/2015 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය | විධිවිධාන ප්‍රකාරව සුදුසුකම් ලබා නොතිබූ නිලධාරීන් 08 දෙනෙකුට නිල වාහන වෙන්කර ඒ වෙනුවෙන් රු.1,471,440 ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |
| (ii) | 2015 ජුනි 17 දිනැති අංක පීඊඞී/3/2015 දරන චක්‍රලේඛයේ 2.5 වගන්තිය | විධිවිධාන ප්‍රකාරව සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා හිමි දීමනාව හැර වෙනත් කිසිඳු දීමනාවක් ගෙවිය නොහැකි බව අවධාරණය කර තිබුණි. එහෙත් සභාපති, ක්‍රියාකාරි අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත දිනුම් ඇදීම සඳහා සහභාගී වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,142,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.507,036,703 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,783,386,637 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,276,349,934 ක හෙවත් සියයට 72 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. 2001 සිට 2009 වර්ෂය සඳහා වූ මුළු හිඟ ආදායම් බදු බැඳියාව වූ රු.1,208,002,376 ක මුදල 2017 වර්ෂය තුලදී ගෙවීම් කිරීම, ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී රු.2,126,428,341 ක් වූ 2013 වර්ෂයේ අතිරික්තය 2015 වර්ෂය අවසානයට රු.1,727,063,739 ක් දක්වා පිරිහී තිබූ අතර 2016 වර්ෂයේදී රු.1,783,386,637 ක් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,276,349,934 ක් හෙවත් සියයට 72 කින් පිරිහීමක් නිරීක්ෂණය විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සහ රජයට ගෙවූ බදු යන ගැලපීම් කිරීමෙන් පසු 2013 වර්ෂයේදී රු.3,086,604,730 ක් වූ දායකත්වය 2016 වර්ෂයේදී රු.721,228,361 කින් හෙවත් සියයට 23 කින් වර්ධනය වී තිබූ නමුත් 2017 වර්ෂයේදී නැවතත් රු.256,524,904 කින් හෙවත් සියයට 7 කින් පිරිහී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්, ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය දැක්වෙන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | 2017 | 2016 |
|---|---|---|
| | -------- | -------- |
| **<u>මෙහෙයුම් අනුපාත</u>** | සියයට | සියයට |
| විකුණුම් ආදායමට විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 25 | 24 |
| විකුණුම් ආදායමට විකුණුම් පිරිවැය | 58 | 58 |
| **<u>ලාභදායීත්ව අනුපාත</u>** | | |
| දළ ලාභ අනුපාතය | 42 | 42 |
| ශුද්ධ ලාභ අනුපාතය (බදු පෙර) | 17 | 18 |
| ශුද්ධ ලාභ අනුපාතය (බදු පසු) | 3.6 | 12 |
| ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය (බදු පෙර) | 13 | 10 |
| ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය (බදු පසු) | 59 | 16 |
| ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය (බදු පෙර) | 78 | 34 |
| ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය (බදු පසු) | 358 | 51 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස | 89 | 90 |
| **<u>ද්‍රවශීලතා අනුපාත</u>** | | |
| ජංගම අනුපාතය | 1:1.7 | 1:2 |
| ක්ෂණික අනුපාතය | 1:1.8 | 1:2 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කරනු ලබන විකුණුම් හා බෙදාහැරීමේ වියදම්, විකුණුම් මිළෙන් පිළිවෙලින් සියයට 24 හා සියයට 25 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි. තවද ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ අයවැය ගත විකුණුම් හා බෙදාහැරීමේ වියදම්වලට වඩා තථ්‍ය වියදමේ පිළිවෙලින් සියයට 411 ක හා සියයට 353 ක විශාල වැඩිවීමක් නිරීක්ෂණය විය. තථ්‍ය විකුණුම් හා බෙදාහැරීමේ වියදම මුළු මෙහෙයුම් වියදම්වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 90 ක් හා සියයට 89 ක් විය. මෙසේ අධික පිරිවැයක් දැරීම මණ්ඩලය ලබන ශුද්ධ ලාභයට සෘජුව බලපාන අතර එය ජනාධිපති අරමුදලට සිදු කරන දායකත්වයටද අහිතකර ලෙස බලපා ඇති බැව් නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී උපයා ඇති බදු පසු ශුද්ධ ලාභයෙන් සියයට 59 ක්ම ජයග්‍රහයකයින් විසින් ලබා නොගත් ත්‍යාග මුදල් වලින් සමන්විත වී තිබූ අතර එය බදු පෙර ශුද්ධ ලාභයෙන් සියයට 13 ක් විය.

(ඇ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ බදු පසු ශුද්ධ ලාභයෙන් පිළිවෙලින් සියයට 51 ක් හා සියයට 358 ක් ආදායම් බදු ලෙස ගෙවා තිබුණු අතර එය බදු පෙර ලාභයෙන් පිළිවෙලින් සියයට 34 ක් හා සියයට 78 ක් විය. ඉකුත් වර්ෂවලදී ඒ ඒ වර්ෂයන්ට අදාලව ගෙවිය යුතු ආදායම් බදු නිවැරදිව නොගෙවීම හේතුවෙන් එම හිඟ බදු මුදල් නිරවුල් කිරීමට සිදුවීම මත සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී ආදායම් බදු ගෙවීම ශුද්ධ ලාභයේ ප්‍රතිශතයක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 30 දින සිට දිනපතා දිනුම් අදිනු ලබන "අද කෝටිපති" නව ලොතරැයි පත වෙළඳපොළට හඳුන්වා දුන්නද ලොතරැයි අලෙවි ආදායම රු.778,374,934 කින් එනම් සියයට 5.3 කින් අඩුවී තිබුණු අතර විකුණුම් පිරිවැය ද ඊට සාපේක්ෂව රු.406,127,121 කින් එනම් සියයට 4.8 කින් අඩුවීම, දළ ලාභ අනුපාතය ඒකාකාරීව පැවතීම කෙරෙහි බලපා තිබුණි.

(ඉ) පසුගිය වසර හා සමාලෝචිත වසරේදී ජංගම හා ක්ෂණික අනුපාතය 1:2 ක් ලෙස සමාන අගයක් ගෙන තිබුණි. ඒ අනුව මණ්ඩලයේ ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් පවතින බව නිරීක්ෂණය වන හෙයින් සමාලෝචිත වර්ෂයේදීද කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

බාහිර ආයතනයක් විසින් වාහනයක් වෙනුවෙන් රු.8,095,000 ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා එක් නඩුවක්ද, ආයතනයේ සේවයෙන් පහ කරන ලද නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා අධිකරණ වල නඩු 02 ක් ද ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 සිට 2021 දක්වා වූ වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු මණ්ඩලයේ සංයුක්ත සැලැස්මේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේ සිට 2021 දක්වා ළඟා කරගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු හා ඉලක්කයන්හි ඇස්තමේන්තු ගත ප්‍රමාණයන්, පිරිවැයන් හා කාලවකවානු වගකිව යුතු කළමනාකාරීත්වය යනාදිය පිළිබඳව තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(ii) උක්ත චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව, ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර සංයුක්ත සැලැස්මේ පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද එම පිටපත් ඉදිරිපත් කර තිබුණේ 2017 ජුනි 01 වන දින දීය.

(iii) ඉහත චක්‍රලේඛයේ 9.2 ඡේදය සඳහන් පරිදි සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවය මත මානව සම්පත් සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් මණ්ඩලය විසින් එය පිළියෙල කර නොතිබුණි. පසුගිය වර්ෂවලදී විගණනය විසින් ඒ සම්බන්ධව දැනුවත් කළද එයට කළමනාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

(iv) සංයුක්ත සැලැස්මේ දක්වා තිබුණු ඉලක්ක අතුරින් එක් ඉලක්කයක් වූයේ ජනාධිපති අරමුදලේ දායකත්වය උපරිම කිරීමයි. තවද එය 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍ය ද වේ. එසේ වුවත් එම ඉලක්කය කරා ළඟාවීමට අනුගමනය කරන උපාය මාර්ග සංයුක්ත සැලැස්ම තුළ දක්වා නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඉලක්ක, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග, ඇස්තමේන්තු ගත ප්‍රමාණයන් හා පිරිවැයන් හා අදාළ කාලවකවානුද අයවැයගත ප්‍රතිපාදනයන් ද ඇතුළත් වන පරිදි 2017 වර්ෂය සඳහා මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්ම විස්තරාත්මක ලෙස පිළියෙල කර නොතිබුණි. තවද, මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට හා වාර්ෂික අයවැයට සමගාමීව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව නිරීක්ෂණය නොවූ අතර ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක්ද හඳුන්වාදී නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) ලොතරැයි අලෙවිය හා අලෙවියෙන් ලැබෙන අරමුදල් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් මෙහෙයවා ඇති ලොතරැයි 10 සඳහා දිනුම්වාර 1190 ක් පවත්වා තිබුණු අතර, ලොතරැයිපත් අලෙවිය තුළින් රැස්කර ඇති ආදායම රු.13,981,500,306 ක් විය. එසේම වර්ෂය තුල රැස්කළ ආදායමෙන් රු.7,263,436,665 ක මුදලක් ත්‍යාග ලෙස වෙන්කර තිබුණු අතර ලොතරැයි අලෙවි ආදායමෙන් රු.376,145,499 ක්ද වෙනත් ආදායම් වලින් රු.130,891,204 ක් ද ඇතුළුව ජනාධිපති අරමුදල සඳහා ප්‍රේෂණය කළ මුදල රු.507,036,703 ක් හෙවත් සියයට 3.6 ක් විය.

(ii) දස ලක්ෂපති ලොතරැයියෙන් කිසිදු මුදලක් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණු අතර ඉතිරි ලොතරැයි 9 න් ප්‍රේෂණය කළ මුදල එක් එක් ලොතරැයිය වෙනුවෙන් එකතුකළ ආදායමින් සියයට 0.98 ත් සියයට 5.6 ත් අතර ඉතා කුඩා පරාසයක විය.

(iii) ආදායම රැස්කිරීම සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු.12,078,580,888 ක පිරිවැයක් දරා තිබුණු අතර එම පිරිවැයෙන් සියයට 3.2 ක් ලෙස රු.386,509,683 ක් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දරා තිබුණි.

(iv) මණ්ඩලය විසින් ලොතරැයිපත් විකිණීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 50 ක් ත්‍යාග මුදල් සඳහා වෙන් කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුල ත්‍යාගලාභීන් 172,507,676 ක් වෙත රු.6,920,946,975 ක් ත්‍යාග ලෙස බෙදාහැර තිබුණු අතර එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 3 ක වර්ධනයක් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුලදී, ජයග්‍රාහකයින් විසින් මාස 06 ක කාලය ඉකුත් වීමට මත්තෙන් ලබාගත යුතුව තිබූ රු.297,376,550 ක් වටිනා ත්‍යාග මුදල් අදාළ ජයග්‍රාහකයින් වෙත පත්කිරීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ලොතරැයිපත් අලෙවිය සඳහා දරන ලද ප්‍රචාරණ පිරිවැයට සාපේක්ෂව ලඟා කරගත් විකුණුම් ආදායමේ කාර්ය සාධනය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශනිදා වාසනාව, ලග්න වාසනාව හා සුපර්බෝල් ලොතරැයිවල ප්‍රචාරණ පිරිවැය පිළිවෙලින් සියයට 34 කින්, සියයට 2.6 කින් හා සියයට 6.5 කින් ඉහළ ගියද විකුණුම් ආදායම පිළිවෙලින් සියයට 8.5 කින්, සියයට 26 කින් හා සියයට 27 කින් පහත වැටී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ගැලැක්සි ස්ටාර් හා දස ලක්ෂපති ලොතරැයි පත්වල ප්‍රචාරණ පිරිවැය පිළිවෙලින් සියයට 9 කින් හා සියයට 11 කින් පහත වැටී තිබුණු අතර එහි විකුණුම් ආදායම පිළිවෙලින් සියයට 34 කින් හා සියයට 50 කින් පහත වැටී තිබුණි.

(iii) ගැලැක්සි ස්ටාර් හා දස ලක්ෂපති ලොතරැයි පත්වල විකුණුම් ආදායමෙන් පිළිවෙලින් සියයට 3.4 ක හා සියයට 9 ක ප්‍රචාරණ වියදමක් දරා තිබුණු අතර අනෙක් ලොතරැයි පත්වල ප්‍රචාරණ වියදම විකුණුම් ආදායමෙන් සියයට 2 ක් වී තිබුණි.

(iv) කෝටිපති ශනිදා ලොතරැයි පතෙහි ප්‍රචාරණ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 0.27 කින් අඩු වී තිබු නමුත් අලෙවි ආදායම් සියයට 34 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) ජනාධිපති අරමුදලට 2014 වර්ෂයේදී ප්‍රේෂණය කළ ශුද්ධ ලාභය රු.මිලියන 2,353 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.මිලියන 507 ක් වී තිබීමෙන් එම අරමුදලට ප්‍රේෂණය කිරීම් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව සියයට 19.17 සිට සියයට 3.6 දක්වා සියයට 81 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී, පෙර වර්ෂවල හිඟ බදු මුදල පියවා දැමීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි.

| | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | **2017** | **2016** | **2015** | **2014** |
| | --------- | --------- | --------- | --------- |
| | රු. | රු. | රු. | රු. |
| විකුණුම් ආදායම | 13,981,500,306 | 14,759,875,240 | 11,874,659,603 | 12,271,477,490 |
| බදු අඩුකළ පසු ලාභය | 507,036,703 | 1,783,386,637 | 1,727,063,739 | 2,353,246,338 |
| බදු අඩුකළ පසු ආදායම විකුණුම්වල ප්‍රතිශතයක් ලෙස | 3.6 | 12.08 | 14.54 | 19.17 |

(ඈ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ මණ්ඩලය විසින් වෙළඳපොලට හඳුන්වා දී ඇති ලොතරැයිපත් දෙක හැර අනෙකුත් සියලුම ලොතරැයිපත්වල අලෙවිය කැපී පෙනෙන ලෙස අඩුවී තිබූ අතර මණ්ඩලයේ සමස්ත ලොතරැයිපත් අලෙවිය 2016 වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 685 කින් අඩුවී තිබුණි. ලොතරැයිපත් අලෙවියේ අඩුවීම සියයට 8.5 ත් සියයට 50.4 ත් අතර පරාසයක විහිදී තිබුණු අතර ලොතරැයිපත් 05 ක අලෙවිය සියයට 25 කට වඩා වැඩි ප්‍රමාණයකින් පහත වැටී තිබුණි.

(ඉ) 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සෑම ලොතරැයි පතකටම අදාළව ලොතරැයිපත් දිනුම් ඇදීමේ වියදම වැඩි වී තිබුණි. එම වැඩිවීම් අතර ශනිදා වාසනාව, සංවර්ධන ලක්ෂපති සහ කෝටිපති ශනිදා යන ලොතරැයිපත් තුනට අදාළ වියදම පිළිවෙලින් සියයට 36, සියයට 49 සහ සියයට 94 ක ප්‍රතිශතයකින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී මිල ගණන් කැඳවා රු.මිලියන 14.5 ක ඇස්තමේන්තු වටිනාකමකට Primedare සමාගම සමඟ 2014 දෙසැම්බර් 31 දින ගිවිසුම්වලටද එළඹ තිබුණි. නමුත් එකී ගිවිසුම කඩකර 2015 මාර්තු 12 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවන බව මණ්ඩලයේ සභාපති විසින් ගනුදෙනුකරු වෙත දැන්වීමෙන් පසුව

කොන්ත්‍රාත්කරු වෙත 2017 මාර්තු 07 දින ඒ වෙනුවෙන් දරන ලද රු.2,500,000 ක වන්දි මුදලක් (Amicable Settelment) ගෙවීමට සිදුවී තිබුණි. කළමනාකාරීත්වය විසින් ගත් තීරණය හේතුවෙන් උපදේශක ගාස්තු රු.996,501 ක්ද, විනිශ්වය ගාස්තු රු.40,000 ක්ද සමග රු.3,536,501 ක පාඩුවක් මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ප්‍රවාහන නිලධාරී තනතුර සඳහා අවිධිමත් ලෙස ලබාදී ඇති පත්වීම නීත්‍යානුකූල නොවන බව දක්වා එම නිලධාරියා සේවයෙන් ඉවත්කර තිබූ අතර එම නිලධාරියා විසින් 2015 මැයි 19 දින නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලීම් කර, නඩුවක් පවරා තිබුණු අතර එය අධිකරණයේ විභාග වෙමින් පවතී. කෙසේ වුවද 2017 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා දරා තිබුණු නීතිඥ ගාස්තුව රු.854,000 ක් වූ අතර එය මණ්ඩලයේ ඉහළ කළමනාකරණය විසින් විධිමත් පරිදි බඳවා ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් මණ්ඩලයට දැරීමට සිදුවූ වියදමක් බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2016 මැයි 17 දින දිනුම් අදින ලද නියතජය 402 වැනි දිනුම්වාරයේදී සුපිරි ජයමල්ල වන රු.10,441,580 ක් හිමි ලොතරැයිපත වෙනුවෙන් එහි මුද්‍රණකරු වන Digiscan ආයතනයේ සේවකයෙකු විසින් ව්‍යාජ ලොතරැයිපතක් මුද්‍රණය කර තිබුණි. එම ආයතනය සමග ඇති කරගෙන තිබූ ගිවිසුමේ 6 වන වගන්තිය ප්‍රකාරව, මෘදුකාංග දෝෂයක් මත වැරදි හෝ වංචාවක් සිදු වුවහොත් රු.500,000 ක වන්දි මුදලක් අයකර ගත හැකි වුවද ඒ වෙනුවෙන් වන්දි මුදලක්ද අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) දීමනා බෙදීයාමේ විෂමතා හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 251 දෙනෙකු අතර ගෙවා තිබුණු රු.123,505,364 ක් වූ විවිධ දීමනා වර්ගවල මුළු දීමනා වටිනාකමින් සියයට 21 ක් එනම් රු.26,456,847 ක්වූ දීමනා බෙදීගොස් තිබුණේ මණ්ඩලයේ නිලධාරීන් 22 දෙනෙකු අතරය. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණේ මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන සමාලෝචිත වර්ෂයේ දිනුම් ඇදීමේ දීමනා වියදම රු.32,423,800 කින් රු.13,670,850 ක් එනම් සියයට 42 ක්ම, අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරියකු ඇතුළු ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන් 23 දෙනෙකු වෙත හිමිවීමයි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්ෂණික ටිකට්පත් අලෙවිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් වෑන් රථ 08 ක් ජංගම රථ ලෙස යොදා ගෙන තිබුණි. ඒ අනුව ජංගම රථ මඟින් ලොතරැයි අලෙවි කිරීමේදී එක් ටිකට්පතක් සඳහා රු.7.07 ක වියදමක් දැරුවද අලෙවි නියෝජිතවරුන් මගින් අලෙවි කිරීමේදී දරා ඇති පිරිවැය රු.2.67 ක් වී තිබුණි. ඒ අනුව ජංගම රථ මගින් ක්ෂණික ටිකට්පත් අලෙවි කිරීම හේතුවෙන් එක් ටිකට්පතක් සඳහා රු.4.40 බැගින් ටිකට්පත් 2,202,300 ක් වෙනුවෙන් රු.9,690,120 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. කෙසේ වුවද, මෙම තීරණය ගෙන ඇත්තේ ප්‍රවර්ධන කටයුත්තක් ලෙස තරඟකාරීත්වයට මුහුණදීම සඳහා වන බව මණ්ඩලය විසින් වාර්තාකර තිබුණි.

(ආ) මණ්ඩලය විසින් 2017 අගෝස්තු 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි "අද කෝටිපති" නමින් ලොතරැයිපතක් වෙළඳපොලට හඳුන්වාදී තිබුණි. මෙම නව ටිකට්පතේ අලෙවිය වැඩිකර ගැනීමට බෙදාහැරීමේ නියෝජිතවරුන්ට විශේෂ දිරි දීමනා ලෙස ගෙවූ රු.25,813,683 ක් ද ඇතුලුව අලෙවි නියෝජිත කොමිස් හා බෙදාහැරීමේ කොමිස් ලෙස රු.279,496,493 ක් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, අනෙක් සියලුම ටිකට්පත්වල අලෙවිය පහත වැටී තිබුණු අතර ඒ අනුව නව ලොතරැයිපත් හඳුන්වාදීමේදී වෙළඳපොල තරඟකාරීත්වය හා පාරිභෝගික හැසිරීම පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් 31 දින දක්වා සියලුම ලොතරැයිපත්වල නොවිකිණී ඉතිරි වූ ලොතරැයිපත් සංඛ්‍යාව මිලියන 32.5 ක් වූ අතර ඒවායේ මුද්‍රණ පිරිවැය රු.මිලියන 14.5 කට ආසන්න වී තිබුණි.

(ඇ) වාර්ෂික වර්ගීකරණ වාර්තා අනුව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ලොතරැයි වර්ග 08 කින් හා ක්ෂණික ලොතරැයි වලින් එක් එක් ලොතරැයි වර්ගයකින් වෙන් වෙන්ව ගණනය කරන ලද බදු පෙර ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 31 ත් සියයට 85 ත් අතර පරාසයක ප්‍රමාණයකින් පහත වැටී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයට සාපේක්ෂව එසේ පහත වැටී තිබුණු මුළු බදු පෙර ලාභය රු.2,950,124,307 ක් විය.

(ඈ) 2017 මාර්තු 23 දින පැවති අලෙවි නියෝජිතවරුන්ගේ මූල්‍ය ශක්‍යතාව වර්ධනය කිරීම යන මැයෙන් පැවැත්වූ රැස්වීමේදී එකඟ වූ පරිදි අලෙවි නියෝජිතවරු 22 දෙනෙකු විසින් බැංකු ඇපකර ලෙස රු.මිලියන 12.2 ක මුදලක් තැබීම පැහැර හැර තිබුණි.

තවද, සමාලෝචිත වර්ෂය තුළ බෙදාහරින්නන් වෙත රු.මිලියන 108 ක් වටිනා ලොතරැයිපත් ණය පදනම මත ලබාදී තිබුණද, ඒවා අයකර ගැනීමට ප්‍රමාණවත් ඇප තැන්පතු මණ්ඩලය සතුව නොතිබීම නිසා බෙදාහරින්නන් වෙත ලබාදී තිබූ ණය අවදානම රු.මිලියන 105 ක් විය. මේ අනුව ණයට ලබාදෙනු ලබන ලොතරැයිපත්වලට අදාළව අවදානම අවම කර ගැනීම සඳහා ඉහත පියවර ගෙන තිබුණද එම අරමුණු ඉටුවී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දිනුම් අදින ලද ටිකට්පත් 800,940,150 ක් මුද්‍රණය කිරීම සඳහා රු.346,417,188 ක මුද්‍රණ වියදමක් දරා තිබුණු අතර නීතිරීති, පාරිභෝගික හැසිරීම, ලොතරැයි වෙළඳපොල හැසිරීම, එක් එක් ලොතරැයිවල ප්‍රතිලාභ ව්‍යුහය තුලින් පාරිභෝගිකයාට අත්වන බලපෑම යනාදී කරුණු ඇතුලුව සමස්ත වෙළඳපොළ පුරෝකථනයන් නොසලකා ලොතරැයිපත් මුද්‍රණය කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මුද්‍රණ වියදම රු.51,748,146 ක් වූ ලොතරැයිපත් 119,656,730 ක් නොවිකිණී ඉතිරි වී තිබූ අතර එම වියදම නිශ්ඵල වියදමක් වී තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාහනවලට ඉන්ධන ලබාදීම පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂාවේදී ඉන්ධන ටැංකියේ ධාරිතාවය ඉක්මවා අවස්ථා 13 කදී වටිනාකම රු.10,678 ක්වූ ඉන්ධන ලීටර් 112 ක් ලබාදී තිබුණි. ඉන්ධන ටැංකියේ ධාරිතාවය ඉක්මවා ඉන්ධන ලබාදුන් ආකාරය විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ආ) අලෙවි ප්‍රවර්ධන අයිතම් (කුඩ හා මග්) සඳහා මණ්ඩලයේ ලියාපදිංචි සැපයුම්කරුවකු විසින් 2017 ජූනි 22 දින මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. අදාළ සැපයුම්කරු විසින් දක්වා තිබුණු ලිපිනයේ නිවැරදිභාවය තහවුරු නොවූ අතර එහි දුරකථන අංකද කිසිවක් සඳහන් කර නොතිබුණි. විගණනය විසින් භෞතිකව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ, මෙවැනි ලිපිනයක් හෝ ආයතනයක් නොමැති බවය.

2016 දෙසැම්බර් 20 දින ප්‍රවර්ධන අයිතම් මිලදී ගන්නා අවස්ථාවේදී ඉහත සැපයුම්කරු විසින් කඳුරට කුඩ ආයතනයේ ප්‍රාදේශීය කළමනාකරුවෙකු (Area Manager) ලෙස පෙනී සිට කඳුරට කුඩ ආයතනයේ ලිපි ශීර්ෂ භාවිතා කර මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එවැනි ප්‍රාදේශීය කළමනාකරුවෙකු එම ආයතනයේ නොමැති බවත්, එම ලිපි ශීර්ෂ ඔවුන්ගේ ලිපි ශීර්ෂ නොවන බවත්, ඉහත ලිපිනයේ කිසිදු ශාඛාවක් නොමැති බවත් කඳුරට කුඩ ආයතනය විසින් විගණනය වෙත තහවුරු කෙරුණි.

තවද, මෙම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද සියළුම ලිපි ඡායා පිටපත් වන අතර මුල් පිටපත් කිසිදු අවස්ථාවක විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, එම ඉදිරිපත් කර ඇති ලිපිවල සඳහන් අත්සන් එකිනෙකට වෙනස් වී තිබුණු බැව් විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය. ඒ අනුව මෙවැනි සාවද්‍ය ආයතනයකින් 2017 වර්ෂය තුලදී රු.1,905,230 ක අලෙවි ප්‍රවර්ධන අයිතම් මිලදී ගැනීම මතභේදයට තුඩුදෙන ගණුදෙනුවක් විය..

(ඇ) ක්ෂණික ලොතරැයි පත් වර්ග අතුරින් Y-144 (B කොටස) 2017 මාර්තු 29 දින වෙළඳපොලට නිකුත් කරන ලෙසද, එම අවස්ථාවේදීම එක් පෙට්ටියකට කුඩ 25 බැගින් යොදා ටිකට්පත් පෙට්ටි 100 ක් නිකුත් කරන ලෙසද අලෙවි අංශය විසින් ගබඩාව වෙත දන්වා තිබුණි. නමුත් ගබඩාවේ ක්ෂණික ටිකට් තොග ලේඛනය අනුව (Y-144 (B)) මෙම ක්ෂණික ටිකට්පත් තොගය 2017 පෙබරවාරි 28 දින නිකුත් කර තිබුණි. තවද ටිකට්පත් නිකුත් කල නිවැරදි දිනය, නිකුත් කරන ලද කුඩ ප්‍රමාණය සහ බෙදාහැරීම් ලේඛනය යනාදී තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. කෙසේ වුවද ප්‍රධාන ගබඩාවේ පැවති ටිකට්පත් තොග 2017 පෙබරවාරි 28 දින උප ගබඩාවලට මාරුකර තිබුණු බව මණ්ඩලය විසින් විගණනයට වාර්තාකර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 හා 2017 වර්ෂ තුල මිලදී ගෙන තිබුණු, තවදුරටත් වර්ෂ 04 ක වගකීම් කාලයක් ඉතිරිව පැවති යතුරු පැදි 03 ක් ඇතුලුව ධාවන තත්ත්වයේ පැවති රු.3,405,757 ක් වටිනා යතුරු පැදි 19 ක් මාස 02 ත් වර්ෂ 2 ½ ත් අතර කාලයක් භාවිතයට නොගෙන ගබඩාවේ නවතා තිබියදී 2016 හා 2017 වර්ෂවලදී වසරකට යතුරු පැදි 06 බැගින් වටිනාකම රු.2,892,999 ක් වූ යතුරු පැදි 12 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන රු.58,355,403 ක තොග ශේෂය තුල රු.1,594,664 ක් වූ ප්‍රයෝජනයට ගත නොහැකි තොග ඇතුලත් වී තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ වාහන නියෝජිත සමාගමකින් රු.8,095,000 ක් වටිනා කැබ් රථයක් මණ්ඩලයේ කිසිදු නිලධාරියකුගේ අනුමැතියකින් තොරව එවකට හිටපු සභාපති විසින් භාරගෙන මණ්ඩලයේ නමට ලියාපදිංචි කර තිබුණද, එදින සිට මෙම වාහනය අස්ථානගත වී තිබුණි. අදාළ සමාගමට මෙතෙක් මුදල් නොගෙවීම මත එම සමාගම විසින් පවරා ඇති නඩුව සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් රු.2,244,685 ක නීතිඥ වියදමක් දරා තිබුණු අතර අදාළ වත්කම මෙතෙක් ලබා ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. එහෙත් එම රථයේ වටිනාකම 2013 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා වාර්ෂිකව ක්ෂය කර තිබූ අතර 2013 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දින දක්වා ජනාධිපති අරමුදලට අහිමි වූ දායක මුදල රු.10,339,635 ක් විය.

(ආ) අලෙවි ප්‍රවර්ධන අයිතම් ලෙස 2009 වර්ෂයේදී සතොස ආයතනයෙන් රු.590,500 ක් වටිනා තෑගි වවුචර්පත් 121 ක් සහ 2013 පෙබරවාරි 18 දින එස්ටීසී ආයතනයෙන් රු.100,000 ක් වටිනා කල් ඉකුත් වූ තෑගි වවුචර් පත් 32 ක්ද ලෙස වටිනාකම රු.690,500 ක වවුචර්පත් භාවිතයට නොගෙන සේප්පුවේ පවතින බැව් නිරීක්ෂණය විය. 2017 ජූනි 12 දින මෙම වවුචර්පත් නැවත අළුත් කර ගැනීමට එම ආයතන වලින් විමසා තිබුණද ඊට එකඟතාවය පළ කර නොතිබුණු බැවින් මෙය මණ්ඩලයට නිශ්ඵල වියදමක් වී තිබුණි. එහෙත් මෙම වියදම තවදුරටත් අලෙවි ප්‍රවර්ධන අයිතම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

## 4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම.

තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයිති අක්කර 01 ක ඉඩම තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගැනීමට එකඟ වී තිබුණද විධිමත් පරිදි බදු ගිවිසුමකට එළඹීමකින් තොරව සංචාරක නිවාසයක් ඉදිකිරීම සඳහා එම ඉඩමේ සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.492,392 ක් මණ්ඩලය විසින් වැයකර තිබුණි.

## 4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය අනුව රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා මණ්ඩලයේ සම්පත් ලබාදිය නොහැකි වුවත්, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට බඳවා ගත් 11 දෙනෙකු බඳවා ගත් දින සිටම මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. මෙම කාර්ය මණ්ඩලය, මණ්ඩලයේ කටයුතු සඳහා කිසිදු දායකත්වයක් දක්වා නොතිබුණු නමුත් මණ්ඩලයේ අරමුදලින් සේවක පාරිශ්‍රමික ලෙස 2016 වර්ෂයේදී හා 2017 ජුනි 19 දක්වා පිළිවෙලින් රු.3,376,415 ක් හා රු.3,725,000 ක් වශයෙන් එකතුව රු.7,101,415 ක් ගෙවීම් කර තිබුණි.

## 4.9 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 269 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 289 ක් විය. ඒ තුල පුරප්පාඩු සංඛ්‍යාව 21 ක් වූ අතර අතිරික්ත කාර්ය මණ්ඩලය 39 ක් විය. කාර්යභාරය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට මණ්ඩලයේ අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා නොගැනීමත්, අනවශ්‍ය තනතුරු සඳහා සීමාව ඉක්මවා බඳවා ගැනීමත් පුරප්පාඩු හා අතිරික්තතා සඳහා හේතු වී තිබුණි.

(ආ) 2006 අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2015 දෙසැම්බර් 16 දින අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ක්‍රමවේදය "ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි පුවත්පත් දැන්වීමකින් හෝ ප්‍රසිද්ධ දැන්වීමකින් ඉල්ලුම් පත් කැඳවා, ලිඛිත තරඟ විභාගයක හා/හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තීරණය කල යුතුය. එහෙත් 2017 වර්ෂය තුල බඳවා ගැනීමේදී ප්‍රසිද්ධ දැන්වීම් පළකර හෝ පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවා නොතිබුණි.

(ඇ) විගණිත දිනය වූ 2018 ජුලි 30 දින වන තෙක් සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) පත් කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුල සිදුකළ රු.386,847,211 ක් වටිනා ප්‍රසම්පාදනයන්, මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුකූලව සිදුවී නොතිබුණු අවස්ථා ගණනාවක් නිරීක්ෂණය විය.

(ඈ) 2016 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් රු.60,000 ක් හා රු.22,104 ක් බැගින් වූ මාසික වැටුපකට මහජන සම්බන්ධතා නිලධාරින්ද, පෞද්ගලික සහකාර ලෙස රු.30,000 ක මාසික වැටුපකට වයස 70 ක් වූ නිලධාරිණියක්ද හා රු.60,000 ක වැටුපකට තවත් නිලධාරිණියක් ද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුමත කර නොගෙන කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ඉ) වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් බඳවා ගැනීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගත යුතු වුවත්, 2016 හා 2017 වර්ෂවලදී එසේ අනුමැතිය ලබාගැනීමකින් තොරව පෞද්ගලික සහකාර, රියදුරු, කළමනාකරණ සහකාර හා විකුණුම් උපදේශක යන තනතුරු සඳහා පිළිවෙලින් රු.30,000 ක, රු.25,918 ක, රු.50,000 ක හා රු.100,000 ක මාසික දීමනාවක් ගෙවීමේ එකඟතාවය අනුව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබුණි.

(ඊ) ඉහත (ඇ) හා (ඉ) ඡේදවල සඳහන් තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණු අතර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව එකම තනතුර සඳහා දැඩි විෂමතාවයක් සහිතව දීමනා ගෙවමින් බඳවාගැනීම් සිදුකර ඇති බව නිරීක්ෂණය විය.

(උ) මණ්ඩලය විසින් අලෙවි කරනු ලබන ලොතරැයිපත්වල අලෙවි ඉලක්ක සපුරා ගැනීමට සහාය වීමට හා අලෙවි කුටි පරීක්ෂා කිරීම සඳහා සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්ෂේත්‍ර නිලධාරීන් 18 දෙනෙකු පත් කර ඇති අතර ඔවුන් විසින් සෑම මසකම ඉදිරි වැඩ සටහනක් (Advance Programme) ඉදිරිපත් කළ යුතු විය. එම වැඩ සටහන අනුව ඔවුන් රාජකාරී ඉටු කරනුයේද යන්න GPS තාක්ෂණය ඔස්සේ අධීක්ෂණය සඳහා නිලධාරීන් 04 දෙනෙකු පත්කර තිබුණද එවැනි අධීක්ෂණයක් සිදුවී නොතිබුණි.

(ඌ) 2017 මාර්තු 24 දින සිට කොන්ත්‍රාත් පදනම මත රියදුරෙකු බඳවා ගෙන තිබූ අතර 2017 සැප්තැම්බර් 30 දින සේවය අහෝසි වී තිබුණි. මෙම නිලධාරියා මණ්ඩලයේ සේවය කළ මාස 06 ක කාල සීමාව තුළ මණ්ඩලයේ කිසිදු කාර්යයකට සක්‍රීය දායකත්වයක් ලබාදී නොතිබුණු නමුත් වැටුප්, අතිකාල, දිරි දීමනා හා පැමිණීමේ දීමනා ලෙස රු.279,744 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(එ) විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව, දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා පුද්ගලික ආයතනයකින් සේවා ලබාගැනීම වෙනුවෙන් 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය වෙනුවෙන් රු.104,716,157 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම කාර්යය වෙනුවෙන් සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) තනතුරක් හා කාර්ය මණ්ඩලයේ 03 දෙනෙකු සමඟ අංශයක් පිහිටුවා තිබූ නමුත් අභ්‍යන්තරිකව ඉටුකර ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු වී නොතිබුණි.

(ඒ) 2016 වර්ෂයේදී රු.782,817 ක් ව පැවති ඒක සේවක පිරිවැය 2017 වර්ෂයේදී රු.948,218 ක් වීමෙන්, රු.165,401 කින් හෙවත් සියයට 21 කින් ඉහළ ගොස් තිබුණි.

**4.10** වාහන උපයෝජනය
-------------------------

(අ) 2009 වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු.10,098,026 ක් වූ හයිවුන්ඩායි වර්ගයේ සුඛෝපභෝගී මෝටර් රථය අපහරණය කිරීම සඳහා 2015 නොවැම්බර් 15 දින භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන තිබුණි. මෙම වාහනය 2015 නොවැම්බර් 01 දින සිට 2016 දෙසැම්බර් 16 දින දක්වා කිසිදු කාර්මික දෝෂයක් නොමැතිව සංචිත වාහනයක් ලෙස මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වයේ අවශ්‍යතා සඳහා යොදාගෙන තිබුණි. අපහරණය කිරීම සඳහා එවකට ප්‍රමාණවත් හේතු නොපැවති බව විගණනය විසින් පෙන්වාදී තිබුණ ද ඉන් අනතුරුව එම වාහනය නොසැලකිලිමත්ව උපයෝජනය කර තිබීම හේතුවෙන් ගියර් පද්ධතියට රු.852,755 ක අළුත්වැඩියා වියදමක් හෝ රු.1,167,637 ක අළුත් ගියර් පද්ධතියක් සවිකිරීමේ වියදමක් වාහන නියෝජිත ආයතනය විසින් ඇස්තමේන්තු කර තිබුණි. එදින සිට වසර 2 ½ ක් වාහනය අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර අනාරක්ෂිතව ගාල්කර තිබුණි. මෙම කරුණ පිළිබඳව විගණනය විසින් දිගින් දිගටම පෙන්වාදීම හේතුවෙන් රු.396,900 ක වියදමක් දරා මෙම වාහනය අළුත්වැඩියා කර 2018 ඔක්තෝබර් 03 දින නැවත මණ්ඩලයේ වාහන සංචිතයට එක් කිරීම නිසා රු.5,000,000 කට අධික වෙළඳපොල වටිනාකමක් මණ්ඩලයට එකතු වී තිබුණි.

(ආ) 2001 සැප්තැම්බර් 14 දින රු.1,425,000 කට මිලදී ගෙන තිබූ වාහනයක් 2017 මාර්තු සිට සංචිත වාහනයක් ලෙස භාවිතා කර තිබුණි. 2016 අප්‍රේල් 20 දින වැඩ කොටස් 14 ක් සඳහා රු.239,749 ක ඇස්තමේන්තුවකින් වැඩ කොටස් 06 ක් හා 2016 ජුනි 15 දින රු.92,139 ක ඇස්තමේන්තුවකින් රු.26,927 ක පිරිවැයක් සහිත වැඩ කොටස් පමණක් අළුත්වැඩියා කර තිබුණි. කෙසේ වුවද පවතින දෝෂ නිසිපරිදි අළුත්වැඩියා නොකර කොටසක පමණක් අළුත්වැඩියා සිදුකරන ලද මෙම වාහනය 2018 අප්‍රේල් 05 දින අපහරණය කර තිබුණි.

(ඇ) 1999 මැයි 24 දින රු.2,943,000 කට මිලදී ගන්නා ලද වාහනයක අළුත්වැඩියා කටයුතු පෞද්ගලික ආයතනවලින් පමණක් සිදු කරවා ගෙන තිබුණු අතර 2016 ඔක්තෝබර් 17 දින පමණක් අළුත්වැඩියාවක් සඳහා නියෝජිත ආයතනය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රු.1,901,864 ක ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි. එම අවස්ථාවේදී පමණක් අලෙවි නියෝජිත සමාගමෙන් ලබාගත් මිල පදනම්ව ආර්ථික වශයෙන් ඵලදායී නොවන බවට වූ ප්‍රවාහන උපදේශකගේ නිර්දේශය මත එම වාහනය අපහරණය කර තිබුණි.

(ඈ) උක්ත (ආ) හා (ඇ) හි සඳහන් වාහන 2 හි තක්සේරු වටිනාකම පිළිවෙලින් රු.1,200,000 ක් හා රු.2,500,000 ක් වූ අතර එහි විකුණුම් මිළ පිළිවෙලින් රු.1,850,000 ක් හා රු.3,550,000 ක් (වැඩිම ඉල්ලුම් මිල රු.3,650,000) වීමෙන් එම වාහන තක්සේරු වටිනාකමට වඩා සියයට 54 කින් හා සියයට 42 කින් වැඩියෙන් අලෙවි වී තිබුණි. ඒ අනුව මෙම වාහන සඳහා ලබාදී ඇති තක්සේරු වටිනාකම් විගණනයේදී මතභේදයට තුඩුදෙන ඒවා විය.

(ඉ) පෞද්ගලික ආයතනවලින් කුලී පදනම මත වාහන ලබා ගැනීමට සිදුවීමෙන් මණ්ඩලයට අධික වාහන පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. එසේ 2017 වර්ෂය තුලදී කුලී පදනම මත වාහන 4 ක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා රු.9,495,518 ක වැය බරක් දරා තිබුණි.

(ඊ) මණ්ඩලයට අයත් වෑන් රථ 8 ක් ක්ෂණික ලොතරැයිපත් අලෙවිය සඳහා ජංගම රථ ලෙස යොදා ගෙන තිබුණු අතර, එම වාහන රියදුරන්ට විධිමත්ව භාරදීම, අලෙවිය සිදු කරනු ලබන ස්ථාන පිළිබඳ GPS තාක්ෂණය ඔස්සේ නිරීක්ෂණය කිරීම, රාත්‍රී කාලයේ අලෙවි නිලධාරීන් හෝ අලෙවි ප්‍රවර්ධන නිලධාරී භාරයේ වාහනය තබා ගැනීම ආදීය සිදුකල යුතු වුවත් එම කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(උ) 2016 හා 2017 යන වර්ෂවලදී මිලදී ගෙන ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලබාදෙන ලද යතුරු පැදි 11 ක් සම්බන්ධව නියෝජිත සමාගම සඳහන් කර ඇති පරිදි ඉන්ධන ලීටරයකින් ධාවනය කල හැකි දුර කිලෝමීටර් 65 ත් 70 ත් අතර විය. නමුත් ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉන්ධන ලීටරයකට කිලෝමීටර් 35 ක් පමණක් ධාවනය කල හැකි බැව් දක්වා ඉන්ධන ලබාගෙන තිබුණි. 2018 අප්‍රේල් 23 දින වන විට යතුරු පැදි 11 ක් ධාවනය කර ඇති මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 293,312 ක් වූ අතර පාරිභෝජනය කර ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 8281 කි. නමුත්, නියෝජිත සමාගම සඳහන් කර ඇති පරිදි ඒ සඳහා වැය වන ඉන්ධන ප්‍රමාණය ලීටර් 4512 ක් වූයෙන්, ලීටර් 3769 ක් සඳහා රු.440,915 ක අතිරික්ත ඉන්ධන වියදමක් දරා තිබුණි.

## 4.11 වෙළඳපොළ කොටස

| වර්ෂය | ලොතරැයි විකුණුම් ආදායම<br>සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු.මිලියන | ලොතරැයි විකුණුම් ආදායම<br>ජාතික ලොතරැයි මණ්ඩලය රු.මිලියන | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස (සියයට) |
|---|---|---|---|
| 2017 | 14,629 | 16,747 | 47 |
| 2016 | 15,314 | 20,170 | 43 |

| | | | |
|---|---|---|---|
| 2015 | 12,280 | 17,394 | 41 |
| 2014 | 12,232 | 15,153 | 45 |
| 2013 | 10,611 | 14,537 | 42 |
| 2012 | 10,668 | 12,024 | 47 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 06 ක ලොතරැයි විකුණුම් ආදායම සැලකිල්ලට ගත්විට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස සමඟ සැසඳීමේදී සාපේක්ෂව අඩු වෙළඳපොළ කොටසක් අත්කර ගෙන තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී සියයට 47 ක් වූ මණ්ඩලයේ වෙළඳපොල කොටස 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සියයට 42 සිට සියයට 43 දක්වා උච්චාවචනයක් සිදු වී නැවත 2017 වර්ෂයේදී සියයට 47 දක්වා වර්ධනය වී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

ඉහත පරිදි 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්දිස්ථාන ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව, මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර තිබූ අතර අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 05 ක ප්‍රමාදයකින් පසුව එනම් 2018 අගෝස්තු 03 දින දීය.

### 6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර 05 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි. නමුත්, ආයතනයේ විෂය පථය ආවරණය කරගත හැකි පරිදි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් එම අංශයට අනුයුක්ත කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන විමසුම්, මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කලද, ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම කාර්යක්ෂමව සිදු නොවන බව නිරීක්ෂණය විය.

## 6.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ දී සිදුකල යුතුව තිබූ සියයට 50 කට ආසන්න ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක වී නොතිබූ අතර ප්‍රසම්පාදන සැලැස්මට පරිබාහිරව රු.මිලියන 98.5 ක ප්‍රසම්පාදනයන් පූර්ව අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. ඉන් රු.මිලියන 56 ක ප්‍රසම්පාදනයන් ආරම්භ කර තිබුණේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) ඡේදය ප්‍රකාරව අයවැය ප්‍රතිපාදන නොතිබියදීය. තවද, මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රසම්පාදන වර්ගය (Procument Catergary) සහ ප්‍රසම්පාදන ක්‍රමය (Procument Method) ඇතුළත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්ම වගකිව යුතු නිලධාරියෙකු අනුමත කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.386,847,211 ක් වූ ප්‍රසම්පාදනයන් 10 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i) අලෙවි ප්‍රවර්ධන අයිතම් මිලදී ගැනීම. රු.5,731,645**

- අලෙවි ප්‍රවර්ධන අයිතම් ලෙස කුඩ හා මග් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය අනුව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 07 ක කාලයක් ලබාදිය යුතු වුවත් දින 03 ක් පමණක් ලබාදී තිබුණි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 (ආ) ඡේදය ප්‍රකාරව ලංසු ඇගයීමේදී වැට් බද්ද සැලකිල්ලට නොගත යුතු වුවද කුඩ 2500 ක මිල ගණන් ඇගයීමේදී එක් ආයතනයක වැට් බද්ද සමග මිල හා අනෙක් ආයතනයේ වැට් බද්ද රහිත මිල සමඟ සසදා තිබීම හේතුවෙන් රු.138,043 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

**(ii) කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාර ලබාදීම රු.7,806,187**

2015 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාරය ලබාදීම වෙනුවෙන් සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබුණු අතර 2017 වර්ෂය තුලදී ඒ වෙනුවෙන් රු.7,806,187 ක් වැයකර තිබුණි. තවද එක් එක් මාසයේදී සේවයට පැමිණි සංඛ්‍යාව ඉක්මවා කෑම ඉල්ලුම් කිරීම නිසා මණ්ඩලය විසින් රු.593,125 ක වැඩිපුර වියදමක් දරා තිබුණි.

**(iii) දස ලක්ෂපති සුපිරි ත්‍යාගය සඳහා වාහන මිලට ගැනීම. රු.8,643,740**

දස ලක්ෂපති ටිකට්පතේ සුපිරි ත්‍යාගය සඳහා මෝටර් කාර් රථ 04 ක් මිලට ගැනීමට අදාළ ඇස්තමේන්තුගත වටිනාකම 2017 ප්‍රසම්පාදන සැලැස්මට හා අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4

ඡේදය හා 2017 මාර්තු 15 දින අතිරේක 33 අනුව රු.මිලියන 10 ක් දක්වා වූ මිලදී ගැනීම් සඳහා අවම වශයෙන් ආයතන 5 කින් මුද්‍රා තබන ලද මිල ගණන් ලබාගත යුතු වීම, 5.3.11 මාර්ගෝපදේශය අනුව ලංසු සුරක්ෂණ ලබාගැනීම හා 8.9.1 මාර්ගෝපදේශය අනුව ගිවිසුම්වලට එළඹීම යන කොන්දේසිවලට අදාළව කටයුතු කර නොතිබුණි. තවද, තාක්ෂණික ඇගයීම් කමිටුවට වාහන සම්බන්ධව දැනුමක් ඇති අයෙකු පත්කර නොතිබුණු අතර, 2017 පෙබරවාරි 27 දින තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලැබීමටත් පෙර 2017 පෙබරවාරි 18 දින සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් එම මෝටර් කාර් රථ මිලට ගැනීමට නිර්දේශ කර තිබුණි.

**(iv) රෝනියෝ යන්ත්‍ර මිලදී ගැනීම. රු.742,500**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් රු.මිලියන 10 ට අඩු මිලදී ගැනීම් සඳහා සුළු ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර තිබුණද මෙම මිලදී ගැනීම් සඳහා එම කමිටුවල අනුමැතිය හා නිර්දේශ ලබාගෙන නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1(ඇ) ඡේදය අනුව ලංසු ලේඛන පිළියෙල කිරීම, 6.1.4 ඡේදය අනුව ලංසු ලේඛන නිකුත් කිරීමේදී වාර්තාවක් පවත්වාගෙන යෑම, 6.3.1 ඡේදය අනුව මුද්‍රා තබන ලද ලංසු ලේඛන ලබා ගැනීම, 5.3.11 ඡේදය අනුව ලංසු සුරක්ෂණ ඉදිරිපත් කිරීම, 6.3.3 ඡේදය අනුව ලංසු ලේඛන විවෘත කිරීමේ කමිටුව පත් කිරීම, 6.3.6 ඡේදය අනුව ලංසු ලේඛන විවෘත කිරීම් වාර්තා කිරීම හා සාමාජිකයන් වාර්තාවේ අත්සන් යෙදීම, 5.3.10 ඡේදය අනුව ලංසු වලංගු කාලසීමාව තුල කටයුතු නිම කිරීම, 8.9.1 (ආ) ඡේදය අනුව සැපයුම්කාර සමාගම සමඟ විධිමත් ගිවිසුමකට එළඹීම හා 5.4.10 ඡේදය ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ඉදිරිපත් කිරීම යන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කර නොතිබුණි.

**(v) ටී-ෂර්ට් මිලදී ගැනීම. වටිනාකම රු.10,384,200**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 4.2.3 ඡේදය හා 2017 මාර්තු 15 දිනැති අතිරේක 31 අනුව වටිනාකම රු.මිලියන 5 සිට රු.මිලියන 25 දක්වා භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා උපරිම වශයෙන් සති 4 ක කාලයක් පමණක් ගතකල හැකි වුවද, රු.10,384,200 ක් වූ මෙම මිලදී ගැනීම සඳහා දින 193 ක් ගත කර තිබුණි.

**(vi) CCTV කැමරා පද්ධතිය මිලදී ගැනීම. වටිනාකම රු.3,961,977**

CCTV කැමරා පද්ධතිය මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන 29 ක් අතුරින් ආයතන 09 ක් පිරිවිතරයන්ට අනුව මිල ගණන් ඉදිරිපත්කර තිබුණද ඉන් ආයතන 5 ක් ඇගයීමට ලක් නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, ලංසුකරුවන් විසින් ඉදිරිපත් කල තොරතුරු හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ තොරතුරුවල වෙනස්කම් නිරීක්ෂණය විය. එසේම පළමුව කොන්ත්‍රාත්තුව පිරිනැමූ ආයතනය විසින් එදින සිට දින 7 ක් ඇතුළත කාර්ය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (ඇ) ඡේදය අනුව ලංසු සුරක්ෂණය වන රු.50,000 ක මුදල මණ්ඩලය වෙත අයකර ගෙන නොතිබුණි.

**(vii) සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම. රු.1,740,549**

සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුණු සේවක පුහුණු වැඩමුළු දෙකක් සම්බන්ධයෙන් වැඩමුළු පැවැත්වීම සඳහා ආහාර, නවාතැන් හා ශාලා පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව පෞද්ගලික ආයතනයක් තෝරාගෙන රු.401,340 ක් ගෙවීම් කර තිබුණි.

(viii) **ලොතරැයි ප්‍රචාරණ වියදම්. රු.302,609,501**

සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය ලොතරැයි ප්‍රචාරණ කටයුත්ත වෙනුවෙන් රු.302,609,501 ක් වැයකර තිබුණු අතර, මණ්ඩලයේ ප්‍රසම්පාදන සැලැස්ම තුල ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීමේ විස්තර ඇතුලත් කර නොතිබුණි. තවද, ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරා ගැනීමේදී 2007 උපදේශන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7.1, 7.4.4, 5.1.1 හා 5.2.3 ඡේදවල විධිවිධාන වලින් බැහැරව වෙළඳ දැන්වීම් නිර්මාණය හා ප්‍රචාරණ සඳහා රු.6,956,000 ක් ගෙවා තිබුණි.

(ix) **ලොතරැයි පත් මුද්‍රණය රු. 346,417,189**

- ලොතරැයිපත් මුද්‍රණය සඳහා සැපයුම්කරුවෙකු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 ඡේද අනුව ප්‍රසම්පාදන සැලැස්මට හා කාලසටහනට අනුව කටයුතු කර නොතිබුණු අතර, 5.3.2 ඡේදය ප්‍රකාරව ලංසු කැඳවීමේ ආරාධනයෙහි ලංසුකරුට තිබිය යුතු අවශ්‍යාම හා උචිත සුදුසුකම් මොනවාද යන්න ඇතුලත් කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර නොමැති අවස්ථාවකදී මිල ගණන් විවෘත නොකර සුරක්ෂිතව තබන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් දී තිබියදී එය අනුගමනය නොකර මිල ගණන් විවෘත කර තිබුණු අතර 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව මිල ගණන් විවෘත කිරීම විධිමත් පරිදි වාර්තා කර නොතිබුණි.

- ලංසු ලේඛනවල ඇතුළත් විශේෂ කොන්දේසි අංක 5 අනුව ජාතික ලොතරැයි මණ්ඩලයට ලොතරැයිපත් මුද්‍රණය කර සපයනු ලබන ආයතන මුද්‍රණ කටයුතු සඳහා තෝරා නොගත යුතු වුවද ලොතරැයිපත් 03 ක මුද්‍රණ කටයුතු සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ මුද්‍රණ කටයුතු සිදුකර තිබුණු සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබුණි.

- ලංසු ලේඛනවල ඇමුණුම A පරිදි සුදුසුකම්ලත් ලංසුකරුවෙකු වෙත තිබිය යුතු, සුදුසුකම් කිසිවක් සපුරා නොතිබුණු ලංසුකරුවකු, ලොතරැයිපත් 03 ක් මුද්‍රණය සඳහා තෝරාගෙන තිබුණි.

- 2016/2017 වර්ෂය සඳහා මුද්‍රණ කටයුතුවලට අදාල ගිවිසුම 2017 ජූලි 31 දින අවසන් වී තිබුණු අතර 2017/2018 වර්ෂයට අදාල නව සැපයුම්කරුවකු තෝරාගැනීම සඳහා ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම 2017 ජූලි 31 දින පළකර තිබුණද නව සැපයුම්කරුගේ මුද්‍රණ කටයුතු 2018 ජනවාරි සිට ආරම්භ කර තිබුණි. ඒ අනුව 2017 අගෝස්තු 01 සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල පැරණි සැපයුම්කරුගෙන් මුද්‍රණ කටයුතු සිදුකර ගැනීම හේතුවෙන් රු.9,125,619 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(x) **තොරතුරු තාක්ෂණ ඒකකයේ ඉදිකිරීම් - රු.2,788,948**

ලියාපදිංචි සැපයුම්කරුවන් 09 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවා තිබුණද එක් ආයතනයක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 7 ක කාලයක් ලබා දිය යුතු වුවද දින 3 ක් පමණක් ලබාදී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12 ඡේදය ප්‍රකාරව ඵලදායී තරගකාරී බවක් නොමැති බව පෙනී යන විට ලැබුණු ලංසු ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැඳවිය හැකි වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද, තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරු සමඟ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

## 6.4 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ 2017 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය පිළියෙල කිරිමේදී ටිකට් පතක විකුණුම් වටිනාකම රු.30 ලෙස සලකා පිළියෙල කර තිබුණි. නමුත් 2017 පෙබරවාරි 01 දින සිට නැවත ටිකට්පතක විකුණුම් මිල රු.20 වූයෙන් ඒ අනුව සංශෝධිත අයවැය ලේඛනය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. එම හේතුව නිසා සත්‍ය ආදායම් වියදම් හා අයවැය ගත ආදායම් වියදම් සමඟ සැසඳිය නොහැකි විය. ඒ අනුව අයවැය තාත්විකව පිළියෙල කර නොතිබීම, වරින් වර එය සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් ප්‍රමාණවත් පරිදි පාලන කාරකයන් වශයෙන් යොදාගෙන නොතිබුණු බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය පරිදි අයවැය ලේඛනය තුළ අයවැය ගත ශේෂ පත්‍රයද ඇතුළත් විය යුතු වුවත් මණ්ඩලයේ අයවැය තුළ අයවැය ගත ශේෂපත්‍රය ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය සඳහා දිනුම් අදිනු ලබන ලොතරැයිපත් හා ක්ෂණික ලොතරැයිපත් මුද්‍රණය සඳහා අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු ගත වියදම රු.මිලියන 307 ක් වූ අතර ප්‍රසම්පාදන සැලැස්ම අනුව වියදම රු.මිලියන 468 කි. එම රු.මිලියන 468 වියදම තුල අද කෝටිපති හා සංවර්ධන වාසනාව සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 24 ක් ඇතුළත් වී නොතිබුණි. කෙසේ වුවද 2017 වර්ෂය සඳහා සත්‍ය වියදම රු.මිලියන 346 ක් වූයෙන් අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම එකිනෙකට සමගාමීව පිළියෙල කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

## 6.5 නොවිසඳි ඇති විගණන ඡේද

ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද, සමාලෝචිත වර්ෂය දක්වාම ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණු මූල්‍යමය වටිනාකම රු.297,416,453 ක් වූ විගණන ඡේද 13 ක් ඇතුළුව විසඳී නොමැති විගණන ඡේද 19 ක් විය.

## 6.6 සමාජ වගකීම් ඉටුකිරීම

### (අ) ජනාධිපති අරමුදලට මණ්ඩලයේ දායකත්වය

1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 (1) (ආ) හි පරිදි කටයුතු සිදුවේද යන්න තහවුරු කර ගැනීමට පසු විපරම් ක්‍රියාවලියක් සිදුවී නොතිබීම හේතුවෙන්, මණ්ඩලයෙන් සිදුවිය යුතු සමාජ වගකීම නිසි පරිදි ඉටුවී ඇත්ද යන්න ප්‍රශ්නගත කරුණක් විය. පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11(1) (ආ) වගන්තිය ප්‍රකාරව ජනාධිපති අරමුදලට මණ්ඩලය විසින් ප්‍රේෂණය කරන මුදලින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට දායක මුදල් ලබාදිය යුතු විය. එහෙත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙනුවෙන් 2017 වර්ෂයේ දායක වූ රු.මිලියන 254 ක මුදල ඇතුළුව 2012 වර්ෂයේ සිට ජනාධිපති අරමුදලින්, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ලැබිය යුතුව තිබුණු රු.මිලියන 972 ක් වූ මුදල්, එම අරමුදලට ලැබී නොතිබුණි.

(ii) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදලින් රු.මිලියන 263 ක් වටිනා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව එකී අරමුදල වෙනුවෙන් ජනාධිපති අරමුදල මඟින් දැරීමට, මහපොළ අරමුදලින් හෝ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතින් අනුමැතියක් ලැබී නොතිබුණි. මණ්ඩලය විසින් ජනාධිපති අරමුදලට හා මහපොළ උසස් අධ්‍යාපන අරමුදල වෙනුවෙන් ප්‍රේෂණය කරන මුදල් ප්‍රමාණයන්, බදු ගෙවීම වෙනුවෙන් හිලව් කරන මුදල් ප්‍රමාණයන්, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට සහ හිමිවිය යුතු මුදල් ප්‍රමාණයන් යනාදිය පිළිබඳව දැනුවත් වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් ලැබූ මුදල පමණක් සටහන් කිරීමේ ප්‍රතිපත්තියත් අනුගමනය කිරීමත්, මණ්ඩලය විසින් පසු විපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොකිරීමත් නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 (1) (ආ) වගන්තිය ප්‍රකාර අරමුණු නිසිපරිදි ඉටුවී ඇත්ද යන්න ප්‍රශ්නගත කරුණක් විය.

(iii) 2003 ජූනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කිරීම නිසා මෙම වාර්තාවේ 4.8 හි පරිදි මණ්ඩලයෙන් ජනාධිපති අරමුදලට අහිමි වූ දායකය රු.7,101,415 ක් විය.

**(ආ) දිනුම් ඇදීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය**

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ලොතරැයි දිනුම්වාර 1190 ක් පවත්වා තිබුණු අතර ඒ සඳහා රු.466,033,872 ක වියදමක් දරා තිබුණි. කෙසේ නමුත් දිනුම්වාර 1190 කින් දිනුම්වාර 961 ක් සඳහාම විගණන අධීක්ෂණයක් හෝ නියෝජනයක් ලබා ගැනීමට මණ්ඩලයේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**(ඇ) ත්‍යාගලාභීන්ට ප්‍රතිලාභ හිමිවීම.**

- තිරසාර සංවර්ධන අරමුණු (SDG-10) එස්.ඩී.ජී - 10 අනුව රටතුල පවත්නා අසමානතාවන් අවම කිරීම උදෙසා සමස්ථ ආර්ථිකය තුල ලොතරැයි ප්‍රතිලාභ බෙදීයාමේදී සමාන අවස්ථාවන් පැවතීම තහවුරු වනසේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දිනුම් ඇදීමේ ව්‍යුහාත්මක ක්‍රියාකාරීත්වය සකස් වී ඇති බව නිරීක්ෂණය නොවීය. සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ මණ්ඩලය විසින් පවත්වා තිබූ දිනුම්වාර සංඛ්‍යාව 946 ක් වූ අතර දිනුම් වාර සංඛ්‍යාවට අදාළව ත්‍යාගහිමි ලොතරැයි ප්රමාණය සියයට 25 ක් විය. එහිදී ත්‍යාග ව්‍යුහය සැලකිල්ලට ගත්විට රු.250 ට අඩු ත්‍යාගලාභීන්ගේ ප්‍රතිශතය සියයට 99.68 ක් විය.
- දස ලක්ෂපති ලොතරැයියේ ප්‍රථම ත්‍යාගය සඳහා මුදලින් රු.2,500,000 ක් ලබාදීමට කටයුතු කර තිබුණද, ඒ සඳහා මෝටර් කාර් රථය ලබාදීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේ දිනුම්වාර අවස්ථා 04 ක් සඳහා ත්‍යාග ලෙස වෙන්කල මුදල රු.10,000,000 ක් වුවද මෝටර් රථ 04 සඳහා දරන ලද වියදම රු.8,643,740 ක් වූයෙන් ත්‍යාගලාභීන්ට අහිමි වූ වටිනාකම රු.1,356,260 ක් විය.

**7. පද්ධති හා පාලනයන්**

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | නියෝජිතයින් විසින් සෘජුවම බැර කරන ලද මුදල් හා නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත්වලට පදනම් වූ ගණුදෙනු හඳුනාගැනීමේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හා මුදල් පොත පවත්වාගෙන යාමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම. |
| | (ii) | මුදල් පොතේ නිශ්චිතව හා පැහැදිලිව ශේෂ නොපෙන්වීම හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂ හා බැංකු ප්‍රකාශනවල ශේෂයන් අතර අසාමාන්‍ය වෙනසක් පැවතීමක් තුල කාරක ප්‍රාග්ධන තත්ත්වයේ අසාමාන්‍ය පිරිහීම. |
| | (iii) | තෑගි අවස්ථාවලදී රු.100,000 ට අඩු ටිකට්පත් සඳහා අලෙවි නියෝජිතයින්ට ගෙවීම් කිරීමේදී නිසි ගිණුම් සටහන් තැබීමේ ක්‍රියාවලියක් පවත්වා නොගැනීම. |
| | (iv) | නොලැබුණු මුදල් ලැබුණා සේ සලකා මුදල් පොතේ සටහන් තැබීම. |
| (ආ) ලිපි ලේඛන නඩත්තු කිරීම. | (i) | මුදල් ලැබීම් වෙනුවෙන් ජංගම ගිණුම් 03 ක් පැවතියද, ඒ සඳහා එක් ලැබීම් මුදල් පොතක් පමණක් පවත්වා ගැනීම. |
| | (ii) | අලෙවි නියෝජිතවරුන් විසින් බැංකුවට මුදල් බැර කරන විට අදාල කුවිතාන්සි පරීක්ෂාවකින් තොරව මුදල් පොත පවත්වාගෙන යාම. |
| (ඇ) ගිණුම්කරණය | | මණ්ඩලයේ මූල්‍ය පරිපාලනයේ සහ වාර්තාකරණයේ හා පරිගණකගත පද්ධතීන් ක්‍රියාත්මක නොවීමේ දූර්වලතා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත කරුණු පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්වීම ගැටළු සහගත බව<br>(i) එක් එක් ලොතරැයිය අලෙවිය සඳහා දරණ වියදම්වල නිරවද්‍යතාවය.<br>(ii) එක් එක් බැංකු ගිණුම් ශේෂවල නිරවද්‍යතාවය.<br>(iii) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ටිකට්පත් විකුණුම් ආදායමේ නිරවද්‍යතාවය.<br>(iv) ලැබිය යුතු මුදල්වල නිරවද්‍යතාවය.<br>(v) ත්‍යාග වියදමේ නිරවද්‍යතාවය.<br>(vi) ලැබීම් මුදල් පොතේ දැක්වෙන ශේෂයේ නිරවද්‍යතාවය. |

| | | |
|---|---|---|
| (ඈ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | වාහන පාලනයේ දුර්වලතා හේතුවෙන් වාහන අළුත්වැඩියා පිරිවැය අධික වීම, වාහන විනාශ වෙමින් පැවතීම හා අපහරණය කිරීමට සිදුවීම. |
| (ඉ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව මණ්ඩලය තුල නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වී නොතිබීම. |